සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 7 - ශ්‍රේණිය
## ඉස්ලාම් ධර්මය

**නම/විභාග අංකය :- ..........................................................** **කාලය: පැය 02 යි.**

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- වඩාත් සුදුසු පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) තව්හීද් යන්නෙහි අදහස,
(1) ඒකීයත්වය (2) දූතභාවය (3) පරලොව (4) එක්කෙනෙකි

(02) ඊමාන් මුෆස්සල් යනු,
(1) කෙටිඊමාන් (2) විස්තරාත්මක ඊමාන් (3) සුළු ඊමාන් (4) පැහැදිලි ඊමාන්

(03) අල්ලාහ්ට වාජිබ් වූ ගුණාංග අතරින් "ඉල්මුන්" යනු,
(1) බලය (2) පැනුම (3) සවන්දීම (4) දැනුම

(04) ප්‍රානය අත්පත් කරගන්නා මලක්වරයා,
(1) ඉස්රාෆීල් (අලෛ) (2) ජිබ්රීල් (අලෛ) (3) ඉස්රාඊල් (අලෛ) (4) රකීබ් (අලෛ)

(05) සවුම්ධාරීන් ඇතුළුවන ස්වර්ගයේ දොරටුව වන්නේ,
(1) ෆිර්දවුස් (2) අද්න් (3) රෙයයාන් (4) සලාම්

(06) අවුරුදු දිනයන්හි උපවාසයේ යෙදීම,
(1) හරාම් (2) හලාල් (3) මක්රූහ් (4) මුබාහ්

(07) ආගම් සහ සුහුෆ් පහල වු නබි වරයා,
(1) ආදම් (අලෛ)තුමා (2) මූසා (අලෛ)තුමා (3) ඊසා(අලෛ)තුමා (4) ඉබ්රාහීම්(අලෛ)

(08) අල්අකුර්ආන්හි ප්‍රධාන මූලාශ්‍රය අතරින් දෙවැනි මූලාශ්‍රය,
(1) අල්අකුර්ආන් (2) අල්හදීස් (3) අල්ඉජ්මා (4) අල්කියාස්

(09) අල්අකුර්ආන්හි පළමුවෙන්ම පහළ වූ සූරාව,
(1) සූරා කද්ර් (2) සූරාඅලක් (3) සූරාෆලක් (4) සූරාෆාතිහා

(10) ඉස්ලාමීය ඉතිහාසයේ ප්‍රථමයෙන් ෂහීද් වූ කාන්තාව,
(1)සුමෛයා (රලි) (2)ආයිෂා (රලි) (3) කදීජා (රලි) (4) ෆාතිමා (රලි)

(11) පිරිමින් ගැහැණුන්ගේ ඇඳුම සහ ගැහැණුන් පිරිමින්ගේ ඇඳුම ඇඳීම,

(1) හලාල් (2) මුබාහ් (3) හරාම් (4) මක්රූහ්

(12) නූහ් නබිතුමාගේ නැව අවසන් වරට ගොඩවූ කන්ද,

(1) උහද් (2) ජබලුන් නූර් (3) ජූදි (4) ජබලුර් රහ්මා

(13) ඉස්ලාම් ආගම පිළිගත් හේතු නිසා කාන්තාරයේ පොලව මත දමා වේදනාවන්ට ලක් වූ සහාබි,

(1) අම්මාර් (රළි) (2) යාසිර් (රළි) (3) සුමෛයා (රළි) (4)බිලාල් (රළි)

(14) The Hundred (ද හන්ඩ්‍රඩ්) යන ග්‍රන්ථයෙහි කතුවරයා,

(1) විල්ලියම් මූර් (2) මයිකල් එච් හාර්ට් (3) කීත්මෝර් (4)ජේම්ස් ජීන්ස්

(15) "සත්‍ය වශයෙන් මු:මින්වරුන් ජයග්‍රහණය වූහ" යනු,

(1) අල්අකුර්ආන් වැකියකි (2) හදීස් වදනකි

(3) ඉමාම්වරුන්ගේ වදනවේ (4) ආලිම්වරුන්ගේ වදනවේ

(16) "ඔවුන් දෙදෙනා රෛහාන් පුෂ්පයන්" ලෙසද, ස්වර්ගවාසී තරුණයින්ගේ නායකයා යනුවෙන් නබි(සල්)තුමා ප්‍රකාශ කළේ,

(1) අලි(රළි),උමර් (රළි) (2) අබුබක්කර් (රළි), උමර්(රළි)

(3) කාසිම්, අබ්දුල්ලාහ් (4) හසන්(රළි),හුසෛන්(රළි)

(17) උම්මහාතුල් මු:මිනින්වරුන් යනු,

(1) මු:මින්වරුන්ගේ මැණිවරුන් (2) මු:මින්වරුන්ගේ නායකයන්

(3) මුස්ලිම් වූ කාන්තාවන් (4) නබිවරුන්ගේ මැණිවරුන්

(18) නබි(සල්) තුමාගේ බිරිඳ සහ උමර් (රළි)තුමාගේ දියණිය වූ කාන්තාව,

(1) ආයිෂා(රළි) (2) ෆාතිමා(රළි) (3) කදීජා(රළි) (4) හෆ්සා(රළි)

(19) මක්කාවේ සිට පැමිණි මුස්ලිම්වරුන්ව පිළිගත් මදීනා වැසියන්,

(1) අන්සාරිවරුන් (2) අහ්ලුල්බෛත් (3) මුහාජිර්වරුන් (4) අහ්ලුල්මදීනා

(20) හින්ද් නම් ස්වාභාවික නම සඳහන් වූ සහාබි කාන්තාව,

(1) හෆ්සා(රළි) (2) උම්මුසල්මා(රළි) (3) කදීජා(රළි) (4) උම්මුකුල්සුම්(රළි)

(ලකුණු 2×20 = 40)

# II කොටස

සැලකිය යුතුයි.

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමුවන ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

(01) (1) මදීනාවෙහි අනිවාර්ය කරන ලද ඉබාදතයන් දෙකක් සඳහන් කරන්න.

(2) මුහාජිර්වරු, අන්සාරිවරු යනු කවුරුන් ද?

(3) නබි (සල්)තුමා සහභාගී වූ සටන් දෙකක් නම් කරන්න.

(4) නබි (සල්)තුමා මදීනාවෙහි යුදෙව්වරුන් සමඟ ඇති කරගත් ගිවිසුම හැඳින්වෙන්නේ කුමන නමකින්ද ?

(5) ඉස්ලාමීය අවුරුදු (දින දර්ශනය) සඳහා පදනම් වූ සිද්ධිය කුමක් ද?

(6) මදීනාවට හිජ්රත් ගිය පසු නබි(සල්)තුමා කුමන කණ්ඩායම් අතර සහෝදරත්වය ඇති කළේ ද?

(7) මස්ජිදුන් නබවි මගින් සමාජයට සිදුවූ සේවාවන් දෙකක් ලියන්න.

(8) ඊමාන්හි කොටස් හි උසස්ම දේ හා පහලම දේ කුමක් ද?

(9) සුන්නා යනු කුමක් ද?

(10) දුආ, දික්ර් යන අරාබි පදයන් හි තේරුම් ලියන්න.

(ලකුණු 2 × 10 = 20)

(02) (1) ඊමාන්හි කොටස් දෙක කුමක් ද?

(2) අල්ලාහ්ගේ ගුණාංග අතරින් "ජාඉස්" යනු කුමක් ද?

(3) මලාඉකවරුන්ගේ ගුණාංග තුනක් සඳහන් කරන්න.

(4) පිරිසිදු කර භාවිතා කළ හැකි නජීස් සඳහා නිදසුන් තුනක් සඳහන් කරන්න.

(ලකුණු 2 +2+3+3 =10)

(03) (1) වුලුහි ප්‍රයෝජන දෙකක් සඳහන් කරන්න.

(2) තයම්මුම් කිරීමට කොන්දේසින් දෙකක් සඳහන් කරන්න.

(3) යහපත් මිතුරුකමේ ප්‍රයෝජන තුනක් සඳහන් කරන්න.

(4) සුහුෆ් 10 බැගින් හිමි වූ නබිවරුන් තිදෙනෙකු නම් කරන්න.

(ලකුණු 2 +2+3+3 =10)

(04) (1) ස්නානයෙහි වර්ග දෙක කුමක් ද?

(2) උපවාසය රැකීමට තහනම් වූ දින දෙකක් සඳහන් කරන්න.

(3) ජමාඅත් සලාතය මගින් ලැබෙන ප්‍රයෝජන තුනක් සඳහන් කරන්න.

(4) දුආ ප්‍රාර්ථනා පිළිගැනීමට තිබෙන කොන්දේසින් තුනක් ලියන්න.

(ලකුණු 2 +2+3+3 =10)

(05) (1) අල්කුර් ආනය හා කලින් පහළ වූ ආගම් අතර තිබෙන වෙනස්කම් දෙකක් සඳහන් කරන්න.

(2) වහී හි කොටස් දෙක කුමක් ද?

(3) නබි(සල්)තුමාගේ බිරින්දෑවරුන් තිදෙනෙකු නම් කරන්න.

(4) මිතුරුකම් දීර්ඝව පවත්වාගෙන යෑම සඳහා ඉස්ලාම් පෙන්වා දී ඇති මගපෙන්වීම් තුනක් සඳහන් කරන්න.

(ලකුණු 2 +2+3+3 =10)

(06) (1) තයම්මුම්හි අවයවයන් කුමක් ද?

(2) අනුන්ගේ දෙයක් අනුමැතියෙන් තොරව භාවිතා කිරීමෙන් ඇතිවන ප්‍රතිවිපාක දෙකක් ලියන්න.

(3) ලැජ්ජාශීලි හැගීම් සම්බන්ධ හදීසයක් ලියන්න.

(4) ලෛලතුල් කද්ර් රාත්‍රියෙහි ඉටුකළ හැකි යහපත් කාර්යයන් තුනක් සඳහන් කරන්න.

(ලකුණු 2 +2+3+3 =10)

(07) තේරුම ලියන්න.

(1) ඊමාන් -

(2) ලෛල් -

(3) අල්ෆු ෂහ්ර් -

(4) අලක් -

(5) ඉන්සාන් -

(6) කලම් -

(7) අල්ලම -

(8) රබ්බුන් -

(9) සහාබා -

(10) අහදුන් -

(ලකුණු 1×10 =10)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 7 - ශ්‍රේණිය

## ඉස්ලාම් ධර්මය - පිළිතුරු

### I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (01) | 1 | (06) | 1 | (11) | 3 | (16) | 4 |
| (02) | 2 | (07) | 2 | (12) | 3 | (17) | 1 |
| (03) | 4 | (08) | 2 | (13) | 4 | (18) | 4 |
| (04) | 3 | (09) | 2 | (14) | 2 | (19) | 1 |
| (05) | 3 | (10) | 1 | 15) | 1 | (20) | 4 |

(ලකුණු 2 × 20 = 40)

### II කොටස

(01) (1) පස්වේල් සලාතය , ජමාඅත්සලාතය, සකාත්

(2) මක්කාවේ සිට මදීනාවට හිජ්රත් ගිය අය - මුහාජිර්වරු

මක්කාවෙන් පැමිණි අය පිළිගත් අය - අන්සාරිවරු

(3) බද්ර් , උහද්, අහ්සාබ්, හුදෛබියා

(4) සහීෆතුල් මදීනා

(5) හිජ්රත් සිද්ධිය

(6) මුහාජිර්වරු හා අන්සාරිවරුන් අතර

(7) ජමාඅත් සලාතය, දැනුම ලබාදෙන ස්ථානය, ප්‍රශ්න නිරාකරණ ස්ථානය

(8) උසස්ම දේ - ලාඉලාහ ඉල්ලල්ලාහ්

පහළම දේ - පාරේ හානී කරන දෙයක් ඉවත් කිරීම

(9) නබි(සල්)තුමාගේ වචන, ක්‍රියා, අනුමතය හා ගුණාංගයන් සුන්නාහ නම් වේ.

(10) දුආ - ප්‍රාර්ථනාව

දික්ර් - අල්ලාහ්ව සිහිපත් කිරීම

(ලකුණු 2 × 10 = 20)

(02) (1) ඊමාන් මුජ්මල් (කෙටි ඊමාන්)

ඊමාන් මුෆස්සල් (විස්තරාත්මක ඊමාන්) (ලකුණු 2)

(2) අල්ලාහ්ට තිබිය යුතු හා නොතිබිය යුතු ගුණාංග (ලකුණු 2)

(3) ආලෝකයෙන් මවා ඇත, ගැහැණු - පිරිමි වෙනසක් නැත, පවුල් ජීවිතය නොමැත, කුසගින්න, නින්ද නොමැත (ලකුණු 3)

(4) සත්තුන්ගේ සම්, මත්පැන්, නජිස් වැටී, උරාගත් කිරි (ලකුණු 3)

(ලකුණු 10)

(03) (1) පව් කමා ලැබීම, කායික පිරිසිදු කම ලැබීම, කියාමත් දිනයේ අවයවයන් දිලිස්සීමට පත් වේ (ලකුණු 2)

(2) ජලය නොලැබූ අවස්ථාව, ජලය භාවිතයෙන් ලෙඩ රෝග වර්ධනය වේ යනු අවස්ථාව,
බීමට පමණක් ජලය තිබීම (ලකුණු 2)

(3) පරලොවේ දී හෙවනැල්ල ලබා දෙයි, කියාමාවේ දී උසස් ස්ථානය ලබා දෙයි,
යහපත් ගති ලක්‍ෂණ වර්ධනය වේ (ලකුණු 3)

(4) ආදම් (අලෛ), මූසා (අලෛ), ඉබ්රාහිම් (අලෛ) (ලකුණු 3)

(ලකුණු 10)

(04) (1) ෆර්ල් වූ ස්ථානය, සුන්නත් වු ස්ථානය (ලකුණු 2)

(2) අවුරුදු දින දෙක, සැක සහිත දින, අය්යාමුත් තෂ්රික් දින තුන (ලකුණු 2)

(3) සමානාත්මතාව, සහෝදරත්වය, නායකත්වයට අවනත වීම, සමගිය (තුනක් ලියා ඇත්නම්) (ලකුණු 3 )

(4)
- අල්ලාහ්ගෙන් පමණක් ප්‍රාර්ථනා කිරීම
- පිළිතුරු ලැබේවි යන දෘඩි විශ්වාසයෙන් ප්‍රාර්ථනා කිරීම
- පිළිතුරට ඉක්මන් නොවීම
- හලාල් වූ දේ අනුභව කිරීම
- යහපත් දේ සඳහා ප්‍රාර්ථනා කිරීම (තුනක් ලියා ඇත්නම්) (ලකුණු 3)

(ලකුණු 10)

(05) (1)

| අල්අකුර්ආන් | කලින් පහළ වු ආගම් |
|---|---|
| •කිසිම වෙනසකටවත් ලක් වී නැත | •වෙනසකට පත්ව ඇත |
| •හැම කාලයටම ගැලපෙයි | •පහළ වු කාලයට පමණක් විය |
| •සෑම කෙනාටම පොදුයි | •එක් කොටසකට පමණයි |

(ලකුණු 2)

(2) වහීමත්ලුව්, වහීගෛරු මත්ලුව් (ලකුණු 2)

(3) කදීජා(රලි), ආයිෂා(රලි),හෆ්සා(රලි),උම්මු සල්මා(රලි) (ලකුණු 3 )

(4) යහළුවා සහමුලින්ම තේරුම් ගැනීම,
මිතුරු කම පැවසීම
තෑගී හුවමාරු කර ගැනීම
සලාම් කීම, මුසා බහා, මුආනකා කිරිම
දුආ ප්‍රාර්ථනා පිරීම (ලකුණු 3)

(ලකුණු 10)

(06) (1) මුහුණ සහ දෑත් (ලකුණු 2)

(2) තරහා ඇතිවීම, වැරදි ආකල්ප වර්ධනය වීම, අනුන්ගැන සැකෙන් බැලීම, වෛරය ඇති වීම,
සහෝදරත්වයට හානි පැමිණීම (ලකුණු 2)

(3) නබි(සල්)තුමා පවසයි :-
"ලැජ්ජාශීලී හැඟීම් සැමදා යහපතම ගෙන එයි" (මූලාශ්‍රය බුහාරි මුස්ලිම්)
(ගැලපෙන හදීසයක් ලියා ඇත්නම්) (ලකුණු 3)

(4) කුර්ආන්පාරායනය,කියාමුල්ලෛල් ඉටු කිරිම, දික්ර්,සලවාත් පැවසීම, විත්ර්,තෞබා කිරීම (ලකුණු 3)

(ලකුණු 10)

(07) (1) විශ්වාසය
(2) රාත්‍රිය
(3) මාස දාහක්
(4) ලේ කැටිය
(5) මිනිසා
(6) පෑනක් / ලියන ද්‍රව්‍ය
(7) ඉගැන්නුවා
(8) දෙවියා
(9) යහලුවන්
(10) එක්කෙනා (ලකුණු 1 × 10 = 10)